විෂය - නාට්‍ය හා රංග කලාව

ශ්‍රේණිය - 9

කාලච්ඡේද - 60

| | නිපුණතාවය | ක්‍රියාකාරකම | ඉගෙනුම් පල | අන්තර්ගතය | කාලච් ඡේද |
|---|---|---|---|---|---|
| | | | | | |
| 8 ශ්‍රේණිය කාලච්ඡේද 24 | 02 - ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණ යෙහි යෙදෙයි. | 2.4 .1<br>2.4.2 - චරිතයට ඔබිනා නළුවන් තෝරමු. | ■ නාට්‍ය පෙළට අදාළ චරිත තෝරා ගනියි.<br><br>■ ඒ ඒ චරිත වල ලක්ෂණ පිළිබඳ විමසයි.<br><br>■ .චරිත වල අභ්‍යන්තර සහ බාහිර ලක්ෂණ විමසමින් ගැළපෙන නලුවන් තෝරයි.<br><br>■ නාට්‍ය පෙළෙහි චරිත නිරූපණයට අදාළ රූපණය පිළිබඳ පුහුණුව ලබයි. | ■ නාට්‍ය පෙළෙහි චරිතවලට ගැළපෙන අයුරින් වඩාත් ගැළපෙන නලු නිළියන් තෝරා ගැනීම.<br><br>■ එම නලු නිළියන් චරිත සතර අභිනයෙන් රූපණය කිරීම | 02 |
| | | 2.5.1 - තේමාවක් ඔස්සේ පරිකල්පනය මෙහෙයවමු. ( සාමූහික සහ කේවල) | ■ පරිකල්පනය යනු කුමක්ද යන්න අර්ථ කථනය කර ගනියි.<br><br>■ යම් තේමාවක් ඔස්සේ පරිකල්පනය මෙහෙයවීමට උත්සාහ දරයි.<br><br>■ පරිකල්පනය මගින් නිර්මාණාත්මක චින්තනය වර්ධනය කර ගනියි. | ■ පරිකල්පනය පිළිබඳව කේවල සහ සාමූහික ක්‍රියාකාරකම්. | 02 |
| | | 2.6.1 - සිසුන්ට අභිමත කතාවක් තෝරා ගනියි.<br><br>2.6.2 - නාට්‍යෝචිත වස්තු රුැස් කිරීම. | ■ නාට්‍යයකට උචිත ජනකතාවක් , වෙනත් කතාවක්,හෝ ස්වනිර්මාණ කතාවක් තෝරාගෙන සකස් කරයි.<br><br>■ එහි ඇති නාට්‍යෝචිත අවස්ථා හඳුනා ගනියි. | ■ නාට්‍යයට ගැළපෙන කතාවක් තෝරා ගැනීම.<br><br>■ එහි ඇති නාට්‍යෝචිත අවස්ථා | 03 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | 2.6.3 - සංවාද ගොඩ නැගීම | ■ සංවාද මගින් කතාව ගොඩනගයි. | ■ සංවාදාත්මකව නාට්‍ය පිටපත ගොඩනැගීම. | |
| | | 2.7.1 -රචනා කළ නාට්‍යයට උචිත අයුරින් වේෂභූෂණ නිර්මාණය<br>2.7.2 - තෝරාගත් නාට්‍යයට උචිත නාට්‍යෝපකරණ නිර්මාණය<br><br>2.8.1 - නාට්‍යයට අදාළව අංගරචනය කරමු.<br>2.9.1 - නාට්‍යයට අදාළව වේදිකා පසුතල සැලසුම් කිරීම සහ නිර්මාණය<br>2.10.1 - නාට්‍යයට උචිත සංගීතය නිර්මාණය<br>2.11.1 - ආනුෂාංගික කලා භාවිත කරමින් පෙළ රංගයක් බවට පත් කිරීම.<br><br>ආනුෂංගික අංග රංගය සඳහා භාවිත කිරීම. | ■ වේෂභූෂණ, නාට්‍යෝපකරණ, අංගරචනය,පසුතල, සංගීතය යන ආනුෂංගික අංග හඳුනා ගනියි.<br><br>■ එම ආනුෂංගික අංග රංගයට උචිත පරිදි නිර්මාණය කර යොදා ගනියි.<br><br>■ එම ආනුෂංගික අංග යොදාගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ අවධානය යොමු කරයි. | ■ වේෂභූෂණ, නාට්‍යෝපකරණ, අංගරචනය, පසුතල, සංගීතය යන ආනුෂංගික අංග.<br><br>■ ඒවා සිසුන් විසින් නිර්මාණකරණය | 06 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 03 - නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැලෙයි. | 3.1.1 - නාට්‍යපෙළ අධ්‍යයනය<br>3.1.2 - සිද්ධි පෙළ ගස්වා ඇති ආකාරය විමසීම.<br>3.1.3 - පිටපතෙහි චරිත විමසීම<br>3.1.4 - නාට්‍යයේ තේමාව හඳුනා ගැනීම.<br>5.1.1<br>5.1.2<br>5.1.3<br>මාෂා සහ වලහා නාට්‍යයේ තේමාව ,චරිත රසවිඳීම. | ■ නාට්‍යයෙහි කතා පුවත වටහා ගනියි.<br>■ තේමාව ,සංවාද සහ චරිතවල ස්වභාවය අධ්‍යයනය කරයි.<br>■ පෙළෙහි ඇති විවිධ සිදුවීම් විස්තර කරයි. | ■ නාට්‍ය පෙළෙහි එන කතා පුවත, තේමාව, සංවාද, චරිත නිරූපණය සහ සිද්ධි පෙළ ගැස් වී ඇති ආකාරය.<br>■ මාෂා සහ වලහා නාට්‍යය රසවින්දනය | 06 |
| | | 3.5.1 - භාවාත්මක නාට්‍ය ගීත ගායනා කරමු. | ■ නාට්‍ය ගීත භාවාත්මකව ගායනා කරයි.<br>■ නාට්‍ය ගීත ගායනා කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු පැහැදිලි කරයි. | ■ සිසුන් දන්නා සරල ගීතයක් හා නාට්‍ය ගීතයක් ගායනය.<br>■ නාට්‍ය ගීතයක් ගායනා කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු. | 02 |
| | | 3.6.1 - රංග ක්‍රීඩාවල යෙදෙමු | ■ රංග ක්‍රීඩාවේ යෙදෙයි.<br>■ අවධානයෙන් යුතුව කටයුතු කරයි.<br>■ ක්ෂනිකව යමක් අවධාරණය කර ගනියි. | ■ යමක් ක්ෂණිකව මතක තබා ගැනීමට අදාළ වචන මාලාවක් සහිත කාඩ්පත් ප්‍රදර්ශනය කරමින් සිදු කරන රංග ක්‍රීඩා. | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 04 - නාට්‍ය හා රංග කලාවට හා සම්බන්ධ ශ්‍රී ලාංකීය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි. | 4.1.1<br>4.2.1 - ආගමික කතාවල නාට්‍යමය අවස්ථා සොයමු.<br><br>4.3.1 - ආගමික රංගයෙන් සරු දහම් ගොඩ නගමු. | ■ ආගමික කතා රැස් කරයි.<br><br>■ ආගමික කතා නාට්‍ය සඳහා යොදා ගනියි.<br><br>■ ආගමික නාට්‍ය මගින් උකහා ගත හැකි සාරධර්ම විනිශ්චය කරයි. | ■ ආගමික කතා හඳුනා ගැනීම.<br>■ විවිධ ආගමික කතා වර්ග<br>■ ඒවා නාට්‍යමය නිරූපණය සඳහා යොදා ගැනීම.<br>■ ආගමික කතා සහිත නාට්‍යවල ඇති අගයන් | 01 |
| | | | | | |
| **9 ශ්‍රේණිය**<br><br>**36** | 01 - නාට්‍ය හා රංග කලාව පිළිබඳ සිද්ධාන්ත පැහැදිලි කරයි. | 1.1 - නාට්‍ය පෙළ හඳුනා ගනිමු | ■ නාට්‍ය පෙළක් යනු කුමක්දැයි අර්ථ නිරූපණය කරයි.<br><br>■ නාට්‍ය පෙළක ඇති ලක්ෂණ හඳුනා ගනියි. | ■ නාට්‍ය පෙළ අර්ථ කථනය<br><br>■ නාට්‍ය පෙළක අන්තර්ගත ලක්ෂණ | 01 |
| | | 1.2<br>3.2.1<br>3.3<br>නාට්‍යයක භාවිත ආනුෂංගික අංග විමසීම | ■ ආනුෂංගික අංග යනු කුමක්දැයි ප්‍රකාශ කරයි.<br><br>■ ආනුෂංගික අංග භාවිතයේ වාසි සහ අවාසි විමසයි.<br><br>■ ආනුෂංගික අංග සැලසුම් කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු සාකච්ඡා කරයි. | ■ ආනුෂංගික කලා හඳුනාගැනීම.<br><br>■ නාට්‍යයකට ආනුෂංගික අංග යොදා ගැනීමෙන් ඇති වාසි සහ අවාසි<br><br>■ ආනුෂංගික අංග සැලසුම් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු | 03 |
| | | 1.3<br>ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී රංග ශෛලීන් හඳුනා ගැනීම. | ■ නාට්‍යයක ශෛලීය හඳුනා ගනියි.<br><br>■ කදා වළලු නාට්‍යය කියවමින් එහි ශෛලීය හඳුනා ගනියි. | ■ ලෝකධර්මී, නාට්‍යධර්මී ශෛලීය හඳුනා ගැනීම.<br><br>■ කදා වළලු නාට්‍යයේ දැකිය හැකි නාට්‍ය ශෛලීය | 01 |
| | | 1.4 | ■ ගැටුම යනු කුමක්දැයි හඳුනා ගනියි. | ■ගැටුම යනු කුමක්දැයි හඳුනා ගැනීම. | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | ගැටුම හඳුනා ගැනීම. | ■ ගැටුම විවිධ ප්‍රභේද සහිත බව තේරුම් ගනියි.<br><br>■ කදා වළලු නාට්‍යය ඇසුරෙන් ගැටුම් අවස්ථා නිරීක්ෂණය කරයි. | ■ගැටුම් ප්‍රභේද<br><br>■ කදා වළලු නාට්‍යය ඇසුරෙන් ගැටුම් අවස්ථා හඳුනා ගැනීම. | |
| | | 1.5<br>3.1.1<br>සමාරෝපය යන්න හඳුනාගෙන චරිත වලට පිවිසෙයි. | ■ සමාරෝපය යන්න හඳුනා ගනියි.<br><br>■ සමරෝපයෙහි ප්‍රභේද විමර්ශනය කරයි.<br><br>■ සතර අභිනය භාවිත කරමින් චරිතවලට සමාරෝපය වෙයි.<br><br>■ විවිධ චරිත අනුකරණය කරයි. | ■ සමරෝපය යන්න පැහැදිලි කිරීම.<br>■ සමාරෝපයේ ප්‍රභේද.<br>■ චරිත අනුකරණය හඳුනා ගැනීම.<br>■ සතර අභිනය භාවිතා කරමින් ,විවිධ චරිත අනුකරණය කරමින් සමාරෝපය. | 02 |
| | 02<br>ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි. | 2.1<br>රඟන චරිත හඳුනා ගනිමු. | ■ විවිධ චරිත නම් කරයි.<br><br>■ .චරිතයක ආවේණික ලක්ෂණ හඳුනා ගනියි.<br><br>■ විවිධ චරිත අධ්‍යයනය කරයි. | ■ විවිධ චරිත වර්ග.<br>■ එම චරිතවලට අදාළ විවිධ ගති ලක්ෂණ<br>■ විවිධ චරිත අධ්‍යයනය | 01 |
| | | 2.2<br>2.3<br>භූමිකා සොයමු - භූමිකා රඟමු | ■ චරිත තුළ විවිධ භූමිකා හඳුනා ගනියි.<br><br>■ .චරිතයක සහ භූමිකාවක වෙනස දක්වයි.<br><br>■ විවිධ භූමිකාවලට අනන්‍ය වූ ලක්ෂණ දක්වයි.<br><br>■ විවිධ භූමිකා රඟ දක්වයි. | ■ චරිත තුළ විවිධ භූමිකා හඳුනා ගැනීම.<br><br>■ චරිතයක සහ භූමිකාවක වෙනස<br><br>■ ඒ ඒ භූමිකාවලට අනන්‍ය වූ ලක්ෂණ<br><br>■ විවිධ භූමිකා රඟ දැක්වීම. | 02 |
| | | 2.4<br>තේමාවක් තෝරාගෙන පෙළ රචනය කරමු මෙලෙස | ■ නාට්‍යයකට සුදුසු කතා,සිදුවීම් හෝ අවස්ථා තෝරා ගනියි.<br><br>■ ඒවායෙන් ඉස්මතු වන තේමා පෙළ ගස්වයි. | ■ විවිධ විෂයන් හා පොත පත ඇසුරෙන් නාට්‍ය පෙළ සඳහා සුදුසු කතා හා සිදුවීම් තෝරා ගැනීම.<br><br>■ කතාවක් හෝ සිද්ධි මාලාවක් නාට්‍යපෙළක් බවට පත් කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු. | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ■ .තේමාව උද්දීපනය වන පරිදි නාට්‍ය පෙළක් රචනා කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු විමසයි. | ■ විවිධ තේමා ඉස්මතු වන පරිදි නාට්‍ය පෙළ රචනය | |
| | 03<br>නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නිහැලෙයි. | 3.1.2 - රූපණයේ යෙදෙමු.<br><br>3.5.1 - සාත්වික අභිනය භාවිතා කරමු.<br><br>3.5.2 - ශරීරයේ නම්‍යශීලී බව ඇති කරගනිමු.<br><br>3.5.3 - නාට්‍ය ශෛලීන්ට උචිත සංවාද භාවිතා කරමු. | ■ අභිනය භාවිතයේ වෙනස්කම් හදුනා ගනියි.<br>■ විවිධ මනෝභාව නිරූපණය කර දක්වයි.<br><br>■ ශරීරාංග චලනයෙන් විවිධ අදහස් ප්‍රකාශ කරයි.<br><br>■ නාට්‍ය ධර්මී සහ ලෝකධර්මී සංවාද භාවිත කරයි.<br><br>■ ලෝකධර්මී සහ නාට්‍ය ධර්මී සංවාදවල ලක්ෂණ විස්තර කරයි. | ■ විවිධ චරිත සතර අභිනය භාවිතා කරමින් අනුකරණය<br><br>■ විවිධ සාත්වික භාව නිරූපණය<br><br>■ සතර අභිනයම එකට එකතු කරගත් ක්‍රියා නිරූපණයන්<br>■ ශරීරාංග විවිධාකාරයට චලනය කරමින් අදහස් ප්‍රකාශ කිරීම.<br><br>■ නාට්‍යධර්මී සහ ලෝකධර්මී ආකාරයට සංවාද ප්‍රකාශ කිරීම සහ එහි ලක්ෂණ | 03 |
| | | 3.4.1<br>දර්පණ තල අභ්‍යාසයේ යෙදෙයි. | ■ දර්පණ තල අභ්‍යාසයේ යෙදෙයි.<br><br>■ රංගනයේදී සාත්වික භාව නිරූපණය යොදා ගැනීමට අවශ්‍ය අවබෝධය ලබයි. | ■ දර්පණ තල අභ්‍යාසය<br><br>■ සාත්වික භාව නිරූපණය සදහා ඇස් සබඳතාවයෙහි වැදගත්කම .<br><br>■ දර්පණ තල අභ්‍යාසය මගින් ලැබෙන ප්‍රයෝජන | 01 |
| | | 3.6.2<br>ගමට නමක් - හැඩට හඩක් | ■ නම් පොත, බුද්ධගද්‍යය,සකස්කඩ වැනි පොත් නිවැරදිව උච්චාරණය කරයි.<br><br>■ නම්පොත, බුද්ධ ගද්‍යය ,සකස්කඩ වැනි ග්‍රන්ථ පරිශීලනයෙන් ලබා ගත් අත්දැකීම් හඩ අභ්‍යාස ප්‍රගුණ කිරීමට උපකාරී කර ගනියි. | ■ නම් පොත,බුද්ධ ගජ්ජය, සකස්කඩ වැනි ග්‍රන්ථ නිවැරදිව ශබ්ද නගා උච්චාරණය<br><br>■ එම ග්‍රන්ථ ඇසුරෙන් රංගනයට සුදුසු සංවාද භාවිතයට අවශ්‍ය ආකාරයට කටහඩ භාවිතය | 01 |
| | | 3.6.3<br>පරිකල්පන අභ්‍යාසවල යෙදෙයි. | ■ පරිකල්පනය යනු කුමක්දැයි ප්‍රකාශ කරයි.<br><br>■ පරිකල්පන චින්තනය ඔස්සේ යම් අවස්ථාවක්, සිද්ධියක් නිර්මාණය කරයි. | ■ පරිකල්පන අභ්‍යාස හඳුනාගනීම.<br><br>■ පරිකල්පන අභ්‍යාස. | 01 |
| | | 3.9.1<br>ගයමින් රගමු. | ■ භාවාත්මකව කවි,ගී ගයයි. | ■ ගීත, කවි හා විරිදු ගායනාවන් භාවාත්මක ව ඉදිරිපත් කිරීම. | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ■ .එම කවි, ගී ගයමින් රගයි.<br><br>■ විවිධ කවි,ගී ගායනා කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු විස්තර කරයි. | ■ ඒවා ගයමින් රංගනයේ යෙදීම.<br><br>■ මෙම ගායනාවල යෙදීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු | |
| | | 3.9.2<br>නාට්‍යමය රංගන අවස්ථා මූලික කරගනිමින් කතන්දරයක් ඉදිරිපත් කරමු. | ■ විවිධාකාරයේ කතන්දර ප්‍රකාශ කරයි.<br><br>■ කතන්දරයක ඇති නාට්‍යමය ලක්ෂණ අවබෝධ කර ගනියි.<br><br>■ කතන්දරයක් නාට්‍යමය ආකාරයෙන් ඉදිරිපත් කරයි. | ■ සිසුන් දන්නා අර්ථවත්, රසවත් කතන්දරයක් අසාගෙන සිටින පිරිසට රංගාත්මකව ඉදිරිපත් කිරීම. | 02 |
| | 04<br>නාට්‍ය හා රංග කලාව විෂයට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි. | 4.1<br><br>බෞද්ධ පූජාකර්මවල නාට්‍යමය ලක්ෂණ හඳුනා ගැනීම. | ■ බෞද්ධ පූජාකර්ම නම් කරයි.<br><br>■ ඒවායේ නාට්‍යමය ලක්ෂණ විමසයි. | ■ විවිධ බෞද්ධ පූජා කර්ම<br>■ එම බෞද්ධ පූජා කර්මවල ඇති නාට්‍යමය ලක්ෂණ | 02 |
| | | 4.2.1<br>4.2.2<br>4.2.3<br>4.2.4<br>4..3<br>නාට්‍යකරුවන් සහ රංගන ශිල්පීන් | ■ එදිරිවීර සරච්චන්ද්‍ර,දයානන්ද ගුණවර්ධන.ගුණසේන ගලප්පත්ති යන නාට්‍යකරුවන්ගේ නාට්‍ය නිර්මාණ නම් කරයි.<br><br>■ ඔවුන්ගේ නාට්‍යවලට පාදක වූ කතා වස්තු,තේමාවන්,පිළිබඳව විස්තර කරයි.<br><br>■ සාලමන් ෆොන්සේකා,නිශ්ශංක දිද්දෙණිය,මාලනී රණසිංහ,සෝමලතා සුබසිංහ,යන රංගන ශිල්පීන් හඳුනා ගනියි.<br><br>■ ඔවුන් විසින් රගපාන ලද වේදිකා සහ ටෙලි නාට්‍යවල රංගන දායකත්වයන් විමසා බලයි. | ■ එදිරිවීර සරච්චන්ද්‍ර,දයානන්ද ගුණවර්ධන.ගුණසේන ගලප්පත්ති යන නාට්‍යකරුවන්ගේ නාට්‍ය නිෂ්පාදන ,ඒවාට පාදක වී ඇති කතා වස්තු සහ එම නිර්මාණවල ස්වභාවය.<br><br>■ සාලමන් ෆොන්සේකා,නිශ්ශංක දිද්දෙණිය,මාලනී රණසිංහ,සෝමලතා සුබසිංහ,යන රංගන ශිල්පීන් විසින් චරිත නිරූපණය කරන ලද නාට්‍ය, සිනමා සහ ටෙලි නාට්‍ය කෘති. | 03 |
| | | 4.4.1<br>4.4.2<br>විවිධ ආගමික නාට්‍ය හඳුනා ගැනීම. | ■ බෞද්ධාගමික කතා පුවත්,කිතුණු ආගමික කතා පුවත්හි තේමා ප්‍රකාශ කරයි. | ■ විවිධ ආගමික කතා පුවත් හා ඒවාහි තේමාවන් | 03 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ■ එම ආගමික කතා පුවත්වල නාට්‍යමය අවස්ථා හදුනා ගනියි.<br><br>■ ආගමික කතා පුවත් ඇසුරෙන් ක්ෂණික රංග අවස්ථා නිර්මාණය කරයි. | ■ එම කතා පුවත්වල මූලික සිදුවීම්, චරිත,නාට්‍යමය අවස්ථා හදුනා ගනිමින් ක්ෂණික නිෑපණ අවස්ථාවන් ගොඩනැගීම. | |
| | 05<br>නාටයමය අවස්ථා සෞන්දර්යාත්ම කව විඳ ගැනීම සහ මානව හිතවාදියෙකු ලෙස සමාජගත වීමේ හැකියා ප්‍රදර්ශනය කරයි. | 5.1.1<br>5.1.2<br>5.2.1<br>5.3<br><br>කදා වළලු නාට්‍ය පෙළ රසවින්දනය | ■ කදා වළලු නාට්‍ය පිටපතෙහි කතා වස්තුව,තේමාව,සංවාද,ශෛලිය, චරිත,ගැටුම් අවස්ථා විමසා බලයි.<br><br>■ .කදා වළලු නාට්‍යයට පසුබිම් වූ ජාතක කතාවත්, නාට්‍යපෙළෙත් සමාන අසමානතා පිළිබඳව සාකච්ඡා කරයි.<br><br>■ නාට්‍ය පෙළ රසවිදීමෙන් ලබන ජීවිත පරිඥානය පිළිබඳව පැහැදිලි කරයි. | ■ කදා වළලු නාට්‍ය පිටපත කියවීම.<br><br>■ ජාතක කතාව සහ නාට්‍ය පෙළ සංසන්දනය.<br><br>■ නාට්‍ය පෙළෙන් ප්‍රකාශිත කතා වස්තුව,තේමාව,සංවාද, ශෛලිය, චරිත,ගැටුම් අවස්ථා.<br><br>■ නාට්‍ය පෙළ කියවීමෙන් හෝ නැරඹීමෙන් ලබා ගත හැකි ජීවිත පරිඥානය ඔස්සේ ලබන රසවින්දනය. | 06 |